දුරකථන ) 2698475
தொலைபேசி ) 2698490
Telephone ) 2698507

ෆැක්ස් ) 2692913
பெக்ஸ் ) 2693869
Fax )

විද්‍යුත් තැපෑල )
மின்னஞ்சல் முகவரி ) postmaster@health.gov.lk
e-mail )

වෙබ් අඩවිය )
இணையத்தளம் ) www.health.gov.lk
website )

සුවසිරිපාය
சுவசிரிபாய
SUWASIRIPAYA

මගේ අංකය )
எனது இல )
My No. ) NCCP/CPED/01/2024

ඔබේ අංකය )
உமது இல )
Your No.: )

දිනය )
திகதி ) 22.01.2024
Date )

**සෞඛ්‍ය අමාත්‍යාංශය**
**சுகாதாரம் அமைச்சு**
**Ministry of Health**

---

චක්‍රලේඛ අංක : 01-01/2024

සියලුම පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සියලුම දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්

සියලුම ආයතන ප්‍රධානීන්

සියලුම සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන්

‘ලෝක පිළිකා දිනය’ – **2024** පෙබරවාරි 04

සීඝ්‍රයෙන් ඉහළ යන ගෝලීය පිළිකා වසංගත තත්වයකට අප මුහුණ දී ඇත. Globocan 2020 දත්ත අනුව එම වසරේදී ලොව පුරා නව පිළිකා රෝගීන් මිලියන 19.3 ක් අළුතින් හඳුනාගෙන ඇති අතර, පිළිකා හේතුවෙන් වසරකට මිලියන 10 ක් පමණ රෝගීන් මියගොස් ඇත. මීළඟ වසර විස්ස තුලදී ලොව පිළිකා රෝගීන් ගණන මිලියන 28.5 දක්වා ඉහළ යනු ඇතැයි අපේක්ෂිතය. පිළිකා සත්කාරයේ අඩු ලුහුඬුකම් නැති කිරීම මෙන්ම පිළිකා පිළිබඳ දැනුම්වත් බව වැඩි කිරීම සඳහාත් පිළිකාවේ වර්තමාන තත්වය පිළිබඳ ක්‍රමෝපායයන් වැඩි දියුණු කිරීම සඳහාත් ඉක්මන් ක්‍රියා මාර්ග ගැනීම අවශ්‍ය වී ඇත.

ලෝක සෞඛ්‍ය සංවිධානයට අනුව, අවදානම් සාධකවලට නිරාවරණය වීම අඩු කිරීමෙන් සහ සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවකට අනුගත වීමෙන් පිළිකාවලින් 30-50% ක් වළක්වා ගත හැකිය. දැනුවත් කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති/වැඩසටහන් ශක්තිමත් කිරීම, පිළිකා අවදානම් සාධකවලට නිරාවරණය වීම අවම කිරීම, සෞඛ්‍ය සම්පන්න ජීවන රටාවක් අනුගමනය කිරීමට අවශ්‍ය තොරතුරු සහ සහාය ජනතාවට ලබා දීම පිළිකා වැළඳීමේ අවදානම අඩු කිරීමට හේතුවේ. ශක්තිමත් සෞඛ්‍ය පද්ධතියක් ඇති රටවල පිළිකා කලින් හඳුනා ගැනීමේ වැඩසටහන් සහ දැනුවත් කිරීමේ වැඩසටහන් නිසි පරිදි සිදුවන බැවින් පිළිකා වැළඳීමේ අවදානම බෙහෙවින් අඩු වී ඇත.

2020 ප්‍රකාශිත වාර්ෂික සෞඛ්‍ය දත්තවලට අනුව, ශ්‍රී ලංකාවේ රෝහල් වලදී සිදුවන මරණවලට බලපාන තුන්වන ප්‍රධාන හේතුව ලෙස පිළිකා හඳුනාගෙන ඇත. ජාතික පිළිකා මර්දන වැඩසටහන මඟින් ප්‍රකාශයට පත් කරන පිළිකා ආවේක්ෂණ දත්ත වාර්තාවට අනුව ශ්‍රී ලංකාව තුළ 2021 වසරේ නව පිළිකා රෝගීන් 37,753ක් හඳුනා ගැනුණි. මෙය පිළිවෙලින් ජනගහනය 100,000 කට දළ අනුපාතිකය (Age Standardized Cancer Incidence Rates of Sri Lanka)170.4ක් ද, වයස ප්‍රාමාණිකෘත අනුපාතය (Age Standardized Incidence Rate) 151.3 ක්ද වේ.

පිළිකා රෝගය හේතුවෙන් රෝගියා පමණක් නොව අන් සෑම පුද්ගලයෙක්ම කුමන අයුරකින් හෝ පීඩාවට පත්විය හැක. එමෙන්ම පිළිකා රෝගය හේතුවෙන් පුද්ගල මට්ටමෙන්, පවුල් මට්ටමෙන් හා ප්‍රජා මට්ටමෙන් ඇතිවිය හැකි අහිතකර ප්‍රතිඵල අවම කිරීම සඳහා කටයුතු කිරීමේ හැකියාවක් සියලූ දෙනාම සතුව ඇත. සෑම වසරකම පෙබරවාරි 04 වන දිනය ලෝක පිළිකා දිනය ලෙස නම් කර සියලු දෙනා තුලම පිළිකා පිළිබඳව විශේෂ අවධානයක් යොමු කිරීමට පියවර ගෙන තිබේ. එහි අරමුණ වන්නේ වළක්වා ගත හැකි පිළිකා හේතුවෙන් මියයන මිලියන ගණනක් ජීවිත සුරැකීමට රාජ්‍ය මට්ටමෙන් මෙන්ම පුද්ගල මට්ටමෙන්ද ක්‍රියාත්මක වී පිළිකා සත්කාරයේ අඩු ලූහුඩුකම් අවම කිරීම හා දැනුම්වත් කිරීමේ වැඩසටහන් ද ඇතුළුව විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමයි. 2022-2024 වසර සඳහා ලෝක පිළිකා දිනයේ තේමාව වන්නේ **"සත්කාරයේ හිඩැස පුරවමු"** ("Close the Care Gap") **යන්නයි. "එක්ව හඬ නගමු -ක්‍රියාත්මක වෙමු "**("Uniting our voices and taking action") **යන්න** 2024 වසර සඳහා වූ විශේෂිත තේමාවයි. **එබැවින්, මෙම වසරේ ලෝක පිළිකා දිනය සැමරීමේ මූලික අරමුණ** වන්නේ පිළිකා සත්කාරයේ අඩු ලුහුඩුකම් හඳුනා ගෙන අදාළ පරිදි ඒ සඳහා නිසි පියවර ගැනීම සහ පිළිකා පිළිබඳව දැනුවත්භාවය වැඩි කිරීම තුලින් පිළිකා මුල් අවධිය තුලදීම හඳුනාගැනීම සඳහා යොමු කිරීමය.

මෙම වසරේ තේමාව ක්‍රියාවට නැංවීම සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහන සියලුම සෞඛ්‍ය සේවා ආයතන (සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාල, රෝහල් යනාදී) වලට නිර්දේශ කරනුයේ පහත සඳහන් ක්‍රියාකාරකම් ආයතන හා දිස්ත්‍රික් මට්ටමින් 2024 පෙබරවාරි මාසය තුල පවත්වන ලෙසයි.

1. පිළිකා මර්දනය හා වළක්වා ගැනීම සඳහා සෞඛ්‍ය කාර්ය මණ්ඩල සඳහා සේවාස්ථ පුහුණු වැඩසටහන්
2. පිළිකා මර්දනය හා වළක්වා ගැනීම සඳහා ප්‍රජාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්

දිස්ත්‍රික්ක මට්ටමින් සිදු කරන ඉහත සඳහන් ක්‍රියාකාරකම් වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග, වෛද්‍ය නිලධාරී - මාතෘ හා ළමා සෞඛ්‍ය හා ප්‍රාදේශීය දන්ත ශල්‍ය වෛද්‍යවරුන් විසින් සම්බන්ධීකරණය සිදු කිරීම අපේක්ෂා කරනු ලැබේ. මෙහි දී සිදු කරන දැනුම්වත් කිරීමේ වැඩසටහන් හා පුහුණු වැඩසටහන් සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහන මඟින් ප්‍රකාශයට පත් කර ඇති සැනපත් කට්ටල, පුහුණුකරුවන් පුහුණු කිරීමේ අත්පොත වැනි සෞඛ්‍ය අධ්‍යාපන මෙවලම් භාවිතා කළ හැකිය. මේවා **https://www.nccp.health.gov.lk** වෙබ් අඩවිය තුලින් බාගත කල හැක. සියළුම රෝහල්වල, අධ්‍යක්ෂ හෝ වෛද්‍ය අධිකාරීගේ මගපෙන්වීම යටතේ, වෛද්‍ය නිලධාරී - මහජන සෞඛ්‍ය/වෛද්‍ය නිලධාරී - බෝ නොවන රෝග/වෛද්‍ය නිලධාරී - සෞඛ්‍ය අධ්‍යාපන සහ සෞඛ්‍ය අධ්‍යාපන ඒකකය ඉහත සඳහන් ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කළ යුතුය.

තවද, 2024 ලෝක පිළිකා දිනය සැමරීම සඳහා සිදු කරන වැඩසටහන්වලදී ඔබගේ සක්‍රිය දායකත්වය හා මහ පෙන්වීම අපේක්ෂා කරන අතර එය ඉතා අගය කොට සලකමි. මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු ඔබ ආයතනයේ අදාල සියලු කාර්ය මණ්ඩලවල දැන ගැනීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසද දන්වමි.

මෙම වැඩසටහන් නිසි පරිදි නිම කිරීමෙන් අනතුරුව ලෝක පිළිකා දිනය සැමරීම සඳහා විශේෂයෙන් සිදු කරන ලද කාර්යයන් ඇතුළත් සංක්ෂිප්ත වාර්තාවක් 2024 මාර්තු 15 දිනට පෙර අධ්‍යක්ෂ, ජාතික පිළිකා මර්දන වැඩසටහන වෙත එවීමට කටයුතු කරන ලෙස දන්වමි.

මේ පිළිබඳව වැඩි විස්තර සඳහා ජාතික පිළිකා මර්දන වැඩසටහනේ අධ්‍යක්ෂ දුරකථන අංක 0112368627 හෝ ඊමේල් nccpmohsl@gmail.com හරහා අමතන්න.

........................................

වෛද්‍ය අසේල ගුණවර්ධන

සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්

වෛද්‍ය අසේල ගුණවර්ධන
සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
385, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත,
කොළඹ 10.

පිටපත්:

1. ගරු අමාත්‍ය, සෞඛ්‍ය අමාත්‍යංශය
2. ගරු නියෝජ්‍ය අමාත්‍ය, සෞඛ්‍ය අමාත්‍යාංශය
3. ලේකම්, සෞඛ්‍ය අමාත්‍යාංශය
4. සියලුම පළාත් සෞඛ්‍ය ලේකම්වරු
5. අතිරේක ලේකම් (වෛද්‍ය සේවා) - සෞඛ්‍ය අමාත්‍යාංශය
6. අතිරේක ලේකම් (මහජන සෞඛ්‍ය) - සෞඛ්‍ය අමාත්‍යාංශය
7. නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් - බෝ නොවන රෝග, වෛද්‍ය සේවා I & II, මහජන සෞඛ්‍ය I & II, සැලසුම්, අධ්‍යාපන, පුහුණු හා පර්යේෂණ, දන්ත වෛද්‍ය සේවා, වෘත්තීය සහ පරිසර සෞඛ්‍ය, රසායනාගාර සේවා
8. අධ්‍යක්ෂ - ජාතික පිළිකා මර්දන වැඩසටහන
9. අධ්‍යක්ෂ - පවුල් සෞඛ්‍ය කාර්යාංශය
10. අධ්‍යක්ෂ - බෝ නොවන රෝග ඒකකය
11. අධ්‍යක්ෂ - සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශය
12. අධ්‍යක්ෂ - ප්‍රාථමික සෞඛ්‍ය සේවා
13. අධ්‍යක්ෂ - පරිසර හා වෘත්තිය සෞඛ්‍ය
14. අධ්‍යක්ෂ - දන්ත වෛද්‍ය සේවා
15. අධ්‍යක්ෂ - පෞද්ගලික සෞඛ්‍ය අංශ ප්‍රවර්ධන
16. අධ්‍යක්ෂ - ජාතික සෞඛ්‍ය විද්‍යා ආයතනය
17. අධ්‍යක්ෂ - වතු හා නාගරික සෞඛ්‍ය
18. කාර්යාල පිටපත